

# දේශීය වෙළඳ බැංකු පිරිහීමට පත් කිරීම සහ රුපියල බාල්දු වන්නේ කාගේ යහපතටද ?

ආර්ථික දියුණුවට ඉතාමත් අවශ්‍යවන ණය මුදල් සාධාරණ පොළියකට ලබා දීමට මෙන්ම ඉතිරි කරන අය දිරිගන්වා ඔවුනට ප්‍රමාණවත් පොළී ආදායමක් ලබාදීම අතින්ද දියුණුවන රටක් වන ශ්‍රී ලංකාව තුළ වෙළඳ බැංකුවලට විශාල වගකීමක් හිමිවේ. එමෙන්ම ණය සැපයීමේදී නියම ආර්ථික දියුණුව පදනම් වන සුළු ගොවියාට, දේශීය කර්මාන්තකරුවාට, දේශීය ව්‍යාපාරිකයාට නිර්යාතකරුවාට අවශ්‍ය ණය මුදල් ප්‍රමාණවත් පරිදි ඇප සිද්ධාන්තය මත නොව ව්‍යාපාරවල දියුණුවීමේ හැකියාව මත පිහිටා සැපයීම වැදගත්ය. තවද, ආර්ථිකයේ ඉතා දිළිඳු කොටස් නංවාලීම අරහයා සමාජීය. යුතුකමක් සේ සලකා ඉතා අඩු පොළියට ණය ආධාර සැපයිය යුතුය.

පොදුවේ ගත්කල රජයක පුළුල් ආර්ථික සැලැස්ම ක්‍රියාත්මක වන පරිදි වෙළඳ බැංකු ඔවුන්ගේ කටයුතු හැඩගස්වා ගැනීම ලංකාව වැනි කුඩා දියුණුවන රටකට ඉතාමත් අවශ්‍යවූවකි. මෙවැනි දර්ශනයක පිහිටි වෙළඳ බැංකු රටාවක් නිදහසට පෙර නොවීය. එමෙන්ම ලංකා බැංකුව විශේෂයෙන්, මහජන බැංකුව ආරම්භ කිරීමට පෙරද නොවීය. එකල බැංකු ක්‍රමය ධනපති ව්‍යාපාරික අතලොස්සකකගේ මුදල් අවශ්‍යතාවන් සපුරාලූ යටත් විජිතවාදී රාමුවක පිහිටි මහේශාක්‍ය ආයතන විය.

කෙසේ වුවද, ලංකා බැංකු ජනසතු කිරීම, ග්‍රාමීය බැංකු පිහිටුවීම, මහජන බැංකුව පිහිටුවීම සමග විදේශීය බැංකුවලට අනවශ්‍ය පහසුකම් සැපයූ පසුබිම දුර්වලවීම සමගම රටට ගැලපෙන පරිදි, පොදු ජනතාව ආවරණය කොටගත් බැංකු ක්‍රමයක් බිහිවීම ඇරඹිණ. ජාතික ඉතිරි කිරීමේ බැංකුව බිහිවීමෙන් මෙම තත්වය වඩාත් ශක්තිමත් විය.